# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | |
|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635<br>10120 | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1059 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 26/06/2024<br>පැය 0600 |

## මාධ්‍ය නිවේදනය

### 01. තියුණු ආයුධයකින් පහර දී මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - සෙවනගල පොලිස් වසම

2024.06.25 වන දින සවස් කාලයේ සෙවනගල පොලිස් වසමේ මහගම ජනපදය ප්‍රදේශයේ පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඇති ඝාතනය කර ඇති බවට සෙවනගල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ මහගම ජනපදය, සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු තවත් පුද්ගලියන් දෙදෙනෙකු සමග තම මස්සිනා පදිංචිව සිටින නිවසට පැමිණ සිටි අවස්ථාවේ නිවසේ හිමිකරු සහ ඔහුගේ බිරිඳ අසල්වැසි පුද්ගලයෙකු සමඟ ඇති කරගත් ආරවුලකට මැදිහත් වීමේදී අසල්වැසි පුද්ගලයා විසින් මරණකරුට කැත්තකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත

සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර සිද්ධියෙන් සැකකරුද තුවාල ලබා පොලිස් ආරක්ෂාව යටතේ ඇඹිලිපිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටි. සෙවනගල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට තැත් කිරීමක් - නිවිතිගල පොලිස් වසම

2024.06.25 වන දින සවස් කාලයේ නිවිතිගල පොලිස් වසමේ පාතකඩ ප්‍රදේශයේ පුද්ගලයෙකුට වෙඩි තබා ඇති බවට නිවිතිගල පොලිස් ස්ථානයට ලද දුරකථන පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 38 ක් වූ දික්ඔවිට වත්ත, පාතකඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තුවාලකරු විවාහක පුද්ගලයෙකු වන අතර මෙම පුද්ගලයා පදිංචි නිවසේ ඉදිරිපිට මිදුලේ තම ඥාති පුත්‍රයෙකු සමග රැදී සිටි අවස්ථාවේදී මුහුණ ආවරණය වන පරිදි ආරක්ෂිත හිස් වැසුමක් පැළඳ සිටි නාඳුනන පුද්ගලයෙකු පා ගමනින් තුවාලකරුගේ නිවස ඉදිරිපිටට පැමිණ වෙඩි තබා පලා ගොස් ඇත. වෙඩි වැදීමෙන් ඔහුගේ පැදයකට තුවාල සිදුව ඇති අතර ඔහු නිවැසියන් විසින් නිවිතිගල රෝහලට ඇතුලත් කර ඇත. වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත.

සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා නිවිතිගල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අපරාධ රැසකට අදාල සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.06.21 වන දින මීගමුව පොලිස් ස්ථානයට වාර්තා වූ අතින් පයින් පහරදී මුදල්, රන් මාලයක් හා ජංගම දුරකථයක් කොල්ලකෑමේ සිද්ධිය හා 2024.06.19 වන දින සීදූව පොලිස් ස්ථානයට වාර්තා වූ පහර දී මුදල් හා ජංගම දුරකථන 05 ක් කොල්ලකෑමේ සිද්ධිය සම්බන්ධයෙන් මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර සිද්ධියට අදාල සැකකරුවන් 2024.06.25 වන දින උදෑසන කාලයේ මීගමුව පොලිස් වසමේ කඩොල්කැලේ ක්‍රීඩා පිටිය අසලදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 31 වයස්වල පසුවන අක්කරපනහා හා අළුත්වත්ත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කොල්ලකන ලද භාණ්ඩ වලින් රන් මාලය හා ජංගම දුරකථන 03 ක් පොලිස් භාරයට ගෙන ඇත. මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දියේ ගිලී විදෙස් ජාතික පුද්ගලයෙකු මියයාම - හබරාදූව පොලිස් වසම.

2024.06.25 වන දින සවස් කාලයේදී හබරාදූව පොලිස් වසමේ උනවටුන වෙරළ තීරයේ දිය නාමින් සිටි විදෙස් ජාතික පුද්ගලයෙකු දිය වැලකට හසු වී ගසාගෙන යාමේදී ප්‍රදේශවාසීන් විසින් ගොඩට ගෙන ගාල්ල කරාපිටිය රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇති බවට හබරාදූව පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වන මැලේසියානු ජාතික පුද්ගලයෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හබරාදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. දියේ ගිලී කාන්තාවක් මියයාමක් - වැලිකන්ද පොලිස් වසම.

2024.06.25 වන දින රාත්‍රී කාලයේදී වැලිකන්ද පොලිස් වසමේ අසේලපුර ප්‍රදේශයේ ඕ ඇලේ දිය නාමින් සිටි කාන්තාවක් දියේ ගිලී මියගොස් ඇති බවට වැලිකන්ද පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 56 ක් වූ අසේලපුර, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. ව්‍යාජ මුදල් නෝට්ටු 06 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - තඹුත්තේගම පොලිස් ස්ථානය.**

2024.06.25 වන දින උදෑසන කාලයේ තඹුත්තේගම පොලිස් වසමේ තඹුත්තේගම බස් නැවතුම්පොලේදී තඹුත්තේගම පොලිස් ස්ථානයේ නිලධාරීන් සැකකටයුතු පුද්ගලයෙකු පරික්ෂා කිරීමේදී **රුපියල් 500/= ව්‍යාජ මුදල් නෝට්ටු 06 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 17 ක් වන උඩුනුවර ජනපදය, නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කර ඔහුගේ නිවසේ තිබී ව්‍යාජ මුදල් මුද්‍රණය කිරීමේ උපකරණ රැසක් පොලිසිය විසින් සොයාගෙන ඇත.

තඹුත්තේගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මහියංගණය පොලිස් ස්ථානය.**

2024.06.25 වන දින සවස් කාලයේදී මහියංගණය පොලිස් වසමේ වටවන ප්‍රදේශයේදී මහියංගණය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන වටවන, මහියංගණය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මහියංගණය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2024.06.25 වන දින රාත්‍රී කාලයේදී ඇතිමලේ පොලිස් වසමේ විජේපුර ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන විජේපුර, ඇතිමලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අඹන්පොල පොලිස් ස්ථානය.**

2024.06.25 වන දින රාත්‍රී කාලයේදී අඹන්පොල පොලිස් වසමේ කාසිකොටේ ප්‍රදේශයේදී අඹන්පොල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත

වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන කාසිකොටෙ, අඹන්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. වන අලියෙකු පහරදීමෙන් කාන්තාවක් මියයාම - කහටගස්දිගිලිය පොලිස් වසම**

2024.06.25 වන දින උදෑසන කාලයේ කහටගස්දිගිලිය පොලිස් වසමේ මීගහදිගිලිය ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීම හේතුවෙන් කාන්තාවක් මියගොස් ඇති බවට කහටගස්දිගිලිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 63 ක්වූ මීගහදිගිලිය, කහටගස්දිගිලිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය නිවස ආසන්නයේ කැලෑ ප්‍රදේශයේ දර කැඩීමට ගොස් සිටියදී වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. කහටගස්දිගිලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. බඹරු ප්‍රහාරයක් හේතුවෙන් පාසල් සිසුන් පිරිසක් රෝහල් ගත කිරීමක් - මූතූර් පොලිස් වසම.**

2024.06.25 වන දින සවස් කාලයේ මූතූර් පොලිස් වසමේ මූතූර් 05 ප්‍රදේශයේදී පාසලක 05 වසරේ සිසු සිසුවියන් පිරිසක් පාසලේ අමතර පන්තියකට සහභාගී වී සිටි අවස්ථාවක පාසලට යාබද නිවසක බඹර කූඩුවක් ඇවිස්සීම හේතුවෙන් පාසල් සිසුන්ට හා ගුරුවරයාට බඹරුන් දෂ්ඨ කර රෝහල් ගත කර ඇති බවට මූතූර් පොලිසිය ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**ගුරුවරයා හා සිසුන් 22 ක් ද සිසුවියන් 08 ක්ද මූතූර් රෝහලට ඇතුලත් කර නේවාසිකව ප්‍රතිකාර ලබයි.**

මූතූර් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. හදිසි මරණයක් - පූජාපිටිය පොලිස් වසම.**

2024.06.25 වන දින සවස් කාලයේ පූජාපිටිය පොලිස් වසමේ වටගොඩ ප්‍රදේශයේ පිහා ඔයේ දිය නෑමට ගොස් සිටි කාන්තාවක් පිහා ඔයේ වැටී සිටයදී ප්‍රදේශවාසීන් විසින් බොක්කාවල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට පූජාපිටිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 35 ක් වන වටගොඩ, හාරිස්පත්තුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය බොක්කාවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පූජාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - පැල්මඩුල්ල පොලිස් වසම.**

2024.06.25 වන දින සවස් කාලයේ පැල්මඩුල්ල පොලිස් වසමේ රත්නපුර පැල්මඩුල්ල මාර්ගයේ රිල්හේනවත්ත හංදිය අසලදී රත්නපුර දෙස සිට

පැල්මඩුල්ල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක ගැටීමෙන් මීටර් 28 ක් පමණ දුරට ඇදී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ ගමන් ගත් පැදිකරු මියගොස් පසුපැදිකරු පැල්මඩුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා රත්නපුර රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වන වැලිමළුව, ලෙල්ලෝපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය පැල්මඩුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර පැල්මඩුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - මාන්කුලම පොලිස් වසම.**

2024.06.25 වන දින රාත්‍රී කාලයේ මාන්කුලම් පොලිස් වසමේ මහනුවර යාපනය ඒ 09 මාර්ගයේ පනිච්චන්කුලම් ප්‍රදේශයේදී යාපනය දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ බස් රථයක් ආපදාවකට ලක් ව ඇති අවස්ථාවක රියදුරු සහ එහි සිටි මගීන් කිහිපදෙනෙකු බස් රථයෙන් බැස අළුත්වැඩියාව සිදුකරන් සිටියදී එම දිසාවෙන්ම පැමිණි ලොරි රථයක් රියදුරුට රථය පාලනය කරගැනීමට නොහැකිව ආපදාවට පත් බස් රථයේ පිටුපස ගැටී ඇති අතර බස් රථයහා රියදුරු සහ මගීන් කිහිපදෙනෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බස් රථයේ රියදුරු සහ මගීන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා මාන්කුලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති අතර ලොරි රථයේ රියදුරු හා මගියෙකු තුවාල ලබා කිළිනොච්චිය රෝහලටද ඇතුලත් කර ඇත.

**මරණකරුවන් අතුරින් බස් රථයේ රියදුරු වයස අවුරු 39 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර අනෙක් පුද්ගලයින් දෙදෙනාගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය මාන්කුලම් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**